ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

<u>මේඝලයා ජාතික නීති විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවේ අයදුම්කරුවන් සඳහා ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණ කොළඹ දී පවත්වයි</u>

2022 මේඝලයා ජාතික නීති විශ්ව විද්‍යාල පනත යටතේ ස්ථාපනය කරන ලද මේඝලයා ජාතික නීති විශ්ව විද්‍යාලය ඉන්දියාවේ නව අධ්‍යාපන ප්‍රතිපත්තිය හා සමගාමීව නීති අධ්‍යාපනය සඳහා අනාගතයට යොමු වූ ප්‍රවේශයක් අනුගමනය කිරීමට කැපවී සිටින ආයතනයකි. එය අන්තර් විෂය අධ්‍යයන වැඩසටහන් වලින් සමන්විත සාරගර්භ මුසුවක් හරහා නීති වෘත්තිකයන් සහ විද්වතුන්ගේ මීළඟ පරපුර පෝෂණය කිරීම සඳහා කැප වී සිටියි.

2. මේඝලයා ජාතික නීති විශ්ව විද්‍යාලය 2024 වසර සඳහා උපාධි, පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි පාඨමාලා සඳහා සිසුන්ගෙන් අයදුම්පත් කැඳවයි. මේ අනුව, විශ්ව විද්‍යාලය ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණ 2024 අප්‍රේල් 20 වන දින නො. 185, කොස්වත්ත පාර, රාජගිරිය, කොළඹ යන ලිපිනයේ පිහිටි ගේට්වේ කොලේජ් හිදි පැවැත්වීමට කටයුතු යොද ඇත. මෙය ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ද සමීප වෙමින් අන්තර්ග්‍රහණීය සහ ප්‍රවේශ විය හැකි නීති අධ්‍යාපනයක් ලබා දීම සඳහා වන ගමනේ සුවිශේෂී සන්ධිස්ථානයක් වනු ඇත.

3. වැඩිදුර විස්තර සහ පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් දුරකථන අංක +91-364-3507700 (දිගු අංක - 35) හෝ විද්‍යුත් තැපැල් ලිපින ida@nlumeg.ac.in ඔස්සේ ඉදරිලන්ග් සියෙම්ලියෙ මහත්මිය හා සම්බන්ධ විය හැකිය.

***

කොළඹ
2024 මාර්තු 18